1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත, දකුණු පිටිගල් කෝරළේ, සහ මැද පළාත තුළ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුම්මෝදර බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත විල්ලරවාඩිය යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද "මැල්ලේකැලේ එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. ඒ. ප්‍රනාන්දු විසින් සාදන ලද 2010.07.06 දින අංක 3104 දරන පිඹුරේ (බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. ඒ. ප්‍රනාන්දු විසින් 2021.10.27 දින භූමි ප්‍රමාණය සහ මායිම් තහවුරු කරන ලද) ලොට් අංක 1 ලෙස සලකුණු කර නිරූපනය කර ඇත්තා වූ ද, ප්‍රමාණය අක්කර හතරයි රූඩ් තුනයි පර්චස් විසි හයක් වූ ද (අ.04, රූ.03, පර්.26).

මාරවිල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ J 316/24 දරන වෙළුම/

පත්ඉරුව යනේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 01 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, එහි පස, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

උපාංග සමග විදුලිබල සැපයුම් පද්ධතිය, ජල පහසුකම් පද්ධති උපාංගය, විදුලි සංදේශ උපාංගය සහ වායු සමීකරණ උපාංගය ඇතුලු මෙහි පළමු උපලේඛනයේ සම්පූර්ණයෙන් විස්තර කර ඇති ඉඩම කී ඉඩම් කොටස සඳහා සහ/හෝ ඒ මත වූ ගොඩනැගිල්ල දැනට ස්ථිරව සම්බන්ධ කරනු ලැබ ඇති හෝ සවි කරනු ලැබ ඇති හෝ මෙහි මින් මතු කලින් ස්ථිරව සම්බන්ධ කරනු ලැබිය හැකි හෝ සවි කරනු ලැබිය හැකි සියලු එක්ව හා වෙන් වෙන්ව වූ නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපාංග, සවිකුරු, සවිකිරීම් සහ සේවාවන් ද සමග වේ.

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී. (බැංකුව) ආයතනය වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ජී. එම්. උපේන්ද්‍රා ප්‍රභාෂිණී විසින් සහතික කරන ලද 2021.11.10 දින අංක 495 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කර පවරා දෙන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයට තබා ඒවාට එරෙහිව ප්‍රදානය කරන ලද ණය මුදල්/පහසුකම් මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විද්‍යාල මාවත, වීරහේන, නාත්තන්ඩිය සහ තුම්මෝදර, නාත්තන්ඩිය ලිපිනවල පදිංචි මිහිඳුකුලසූරිය මුතුබන්ධන පෝරුතොටගේ විරාජ් නිරෝෂන් ප්‍රනාන්දු (ජාතික හැඳුනුම්පත් අංක 782945114වී) (ණය ගැණුම්කරු) යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

පහත විස්තර කර ඇති දේපලෙහි සහ පරිශ්‍රයෙහි සින්නක්කර අයිතිකරු "ණය ගැණුම්කරු" විසින් ස්වකීය සින්නක්කර අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ඉහත කී අංක 495 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුව වෙත උකස් කර ඇති හෙයින් ද;

2026 ජනවාරි මස 31 දිනය වන විට ඉහත කී අංක 495 දරන උකස් බැඳුම්කරය මත බැංකුව වෙත මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතු ව පවතින හෙයින් ද;

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව,

උපලේඛනයේ දැක්වෙන දේපළ, ලොට් 1 (අ.04, රූ. 03, පර්. 26)

වර්ෂ 2026 ක් වූ නොවැම්බර් 25 දින පෙ.ව. 11.30 ට

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම :

නාත්තන්ඩිය නගර මධ්‍යයේ සිට "තෝප්පුව-මාදම්පේ" පාර ඔස්සේ තුම්මෝදර පාලම පසුකර "සිරිගම්පල පාර" දක්වා කිලෝමීටර් 2.6ක් පමණ ගමන් කර ඉන්පසු සිරිගම්පල පාරට දකුණට හැරී මීටර් 650ක් පමණ ගමන් කර ඉන්පසු බොරළු පාරට දකුණට හැරී මීටර් 700ක් පමණ ගමන් කර ඉන්පසු වම් අත පැත්තට හැරී දේපළ වෙත ළඟා වීමට පාර අවසානය දක්වා තවත් මීටර් 100ක් ගමන් කරන්න

ගෙවීම් කළ යුතු ආකාරය :-

විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී.හි තැන්පත් කළ යුතුය. ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. පළාත් පාලක අයබදු සියයට එකයි (1%) ;
5. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100% ;
6. ලිපිකරු සහ සෝෂක චේතනය රු. 1,500/-;

වෙනත් කරුණු සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න.:-

කළමනාකරු මධ්‍යගත (අයකිරීම් අංශය),
නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී.,
අංක 40,
නවම් මාවත,
කොළඹ 02.
දුරකථන අංක : 011 2 448 448.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය බලයලත් වෙන්දේසිකරු
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 7/1/10,
1 වන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල,
කොළඹ 08.
දුරකථන අංක : 011- 2396520,077- 3242954

10-595

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව ඇතුළත සහ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 494-C හෝකන්දර දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හෝකන්දර පිහිටා ඇත්තා වූ ද, "දවටගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 01 වැනි දින අංක 7864/9000 දරන පිඹුරේ ලොට් A1 ලෙස දැක්වෙන ඉඩම් කොටස ; ප්‍රමාණය රූඩ් 02 (රූ.02)

හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ B 954/86 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද විශාල ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. කේ. වික්‍රමනායක විසින් සහතික කරන ලද 2016.12.19 දින අංක 2236 දරන උකස් බැඳුම්කරය මගින් ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. ඩී. එම්. වීරක්කොඩි විසින් සහතික කරන ලද 2018.05.03 දින අංක 13 දරන උකස් බැඳුම්කරය මගින් ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එව්. කේ. එස්. අයි. හේරත් විසින් සහතික කරන ලද 2020.07.31 දින අංක 2061 දරන උකස් බැඳුම්කරය මගින් සහ 2022.05.06 දින අංක 2138 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම සෙරන්ඩිබ් ග්‍රීන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සහ සහිදා හෙට්ටිආරච්චි (විවාහයට පෙර නෙයිනා මොහොමඩ් සහිදා) යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, මෙහි පහත විස්තර කර ඇති දේපළහේ සහ පරිශ්‍රයෙහි සින්නක්කර අයිතිකරුවන් වන ණය ගැනුම්කරුවන් විසින් ඉහත කී අංක 2236, 13, 2061 සහ 2138 දරන උකස් බැඳුම්කරයන් යටතේ ඔවුන්ගේ සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාවය බැංකුව වෙත උකස් කර ඇති හෙයින් ද, 2025.08.04 වැනි දිනය වන විට බැංකුව වෙත ඉහත කී උකස් බැඳුම්කරයයන් මත මුදලක් ලැබිය යුතුව පවතින හෙයින් ද, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව ඉහත සඳහන් දේපළ ලොට් අංක ඒ1 (රූ.02)

වර්ෂ 2026 ක් වූ නොවැම්බර් 20 දින පෙ.ව. 10.30 ට

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම :

කොළඹ සිට හයිලෙවල් පාර ඔස්සේ කි.මී. 14.5ක් ගමන් කොට මහරගම සිට තවත් කි.මී. 2.5ක් ගමන් කොට වම් අතට ඇති මාලඹේ පාරේ තවත් කි.මී. 2.5ක් ගමන් කොට හමුවන විද්‍යාල හන්දියෙන් දකුණට හැරී කොට්ටාව පාරේ මීටර් 200ක් ගමන් කළ විට විෂයගත දේපළ වම් අතට වන්නට පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා - 2026.08.21 දින හා රජයේ *ගැසට් පත්‍රය* ද, 2026.06.05 දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකුරල් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය :-
විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) ;
4. ලිපිකරු සහ සෝෂක චෙතනය රු. 2,000/-;
5. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
6. ගැනුම්කරු විසින් එකතු කළ අගය මත වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුය;
7. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-
කළමනාකරු මධ්‍යගත (අයකිරීම් අංශය),
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.,
අංක 40,
නවම් මාවත,
කොළඹ 02.
දුරකථන අංක : 011 2 448 448.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු.

අංක 7/1/10,
1 වන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල,
කොළඹ 08.
දුරකථන අංක : 011- 2396520,077- 3242954

10-600

LE/RE/201

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
(HDFC බැංකුව)

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 603725000094 (1807200108)
ණයකරුගේ සම්පූර්ණ නම : හෙට්ටිආරච්චිලාගේ නදීක හෙට්ටිආරච්චි
හැඳුනුම්පත් අංකය : 822030181V

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ 2019.02.08 වැනි දින අංක 2110 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ සහ වර්ෂ 2019.02.01 වැනි දින "දිවයින", "තිනක්කුරල්" සහ "සිලෝන් ටුඩේ" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර, පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 134, බැද්දගාන පාර, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින්,

2026 නොවැම්බර් මස 26 වන දින ප.ව. 1.30 ට

සිට පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී හෝ HDFC බැංකුව ක්‍රුරුණෑගල ශාඛා පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 693 දරන උකස් බැඳුම්කරය සහ අංක 814/1898 දරන ප්‍රතිව්‍යුහගත ඔප්පුව (ඉන්ඩෙන්චරය) යටතේ රුපියල් එක්කෝටි පන්ලක්ෂ පනස් නව දහස් අටසිය අනූහතරයි ශත හැත්තෑ පහ (රු. 10,559,894.75) ක මුදලක් වර්ෂ 2018.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින් ;
ණය අංකය : 603725000094 (1807200108)

(01) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූඅට ලක්ෂ දස දහස් තුන්සිය පනස් පහයි ශත පනස් අට (රු. 9,810,355.58) ක මුදල ද වර්ෂ 2018.12.31 වන දින දක්වා හිඟ මුදල් වශයෙන් රුපියල් හත්ලක්ෂ හතලිස් නවදහස් පන්සිය තිස්නවයයි ශත දාහත (රු. 749,539.17) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්කෝටි පන් ලක්ෂ පනස් නවදහස් අටසිය අනූහතරයි ශත හැත්තෑ පහ (රු. 10,559,894.75) ක මුදල අයකර ගැනීම සඳහා ද ;

(02) එකී පළමු ණය මුදලෙහි ආපසු නොගෙවූ මුදල වන රුපියල් අනූඅට ලක්ෂ දස දහස් තුන්සිය පනස් පහයි ශත පනස් අට (රු. 9,810,355.58) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.50% ක් ද බැගින් වූ පොළිය 2019.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද ;

(03) 2019.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) එකී ණය මුදලට අදාළ සම්පූර්ණ හිඟ මුදල වන රුපියල් හයලක්ෂ හැට හතර දහස් පන්සිය හතලිස් හතරයි ශත හතලිස් නවය (රු. 664,544.49) ක මුදල මත අයවිය යුතු මාසිකව 2.00% ක ප්‍රමාද පොළියක් අයකර ගැනීම සඳහා ද ;

(04) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අය කළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි (කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 17 වන දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

ණය අංකය 603725000094 (1807200108)

ඉහත කී උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ තිරගන්දහය කෝරළේ, කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ සහ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 832 ගංගොඩ ග්‍රාම නිලධාරී වසමේ ගංගොඩ ග්‍රාමයෙහි පිහිටි පුත්තලම් පාරේ වරිපනම් අංක 447/10 පිහිටි දිවුල්ගහමුලවත්ත සහ නාරංගහමුල කුඹුර දැන් ගාර්ඩන් (කොටස) නමැති ඉඩමට 2014.03.27 වන දින බලයලත් මිනින්දෝරු පී. එස්. ගලගෙදර මහතා විසින් මැන සම්පාදිත අංක 10328 පිඹුර ප්‍රකාර කැබලි අංක 1 ට මායිම්, උතුරට : පිඹුරු අංක 6310 හි කැබලි අංක 2; නැගෙනහිරට : පිඹුරු අංක 815 හි කැබලි අංක 2එෆ් දරන සුන්දරපෙරුම හිමිකම් කියන ඉඩම; දකුණට : පිඹුරු අංක 815 හි කැබලි අංක 2ඒ දරන වන්දුලතා හිමිකම් කියන ඉඩම; බටහිරට : මහනගර සභා පාර (අඩි 20 පළල පාර ද) යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක (අක්.0, රූ.0, පර්.10) *හෙවත්* හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි පහයි තුනක (හෙක්. 0.0253) වපසරියකින් යුතු මෙම ඉඩම සහ ද එහි පිහිටි ඊට අයිති ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේ සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 153/122 හි ලියාපදිංචි කර ඇත.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඩී. තිලකරත්න විසින් 2016.09.13 දින ලියා සහතික කරන ලද අංක 693 දරන උකස්කරය සහ එකී උකස්කරය මත කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඩී. තිලක්සේන විසින් 2017.07.28 වන දින සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. එස්. සී. පෙරේරා විසින් 2017.08.10 දින ඒකාබද්ධව ලියා සහතික කරන ලද අංක 814/1898 දරන ප්‍රතිව්‍යුහගත ඔප්පුව (ඉන්ඩෙන්වරය) අනුව මෙම උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි
සාමාන්‍යාධිකාරී

2026 සැප්තැම්බර් මස 27 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ල,
ශ්‍රීමත් විත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ - 02.

10-533

ඩීඑෆ්සීසී බෑන්ක් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ ඩීඑෆ්සීසී බෑන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් වී. ටී. ඉරුගල්බණ්ඩාර විසින් ලියා සහතික කරන ලද 2021.11.096 දිනැති අංක 1267දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, අනුරාධපුරයේ පදිංචි ගීසර ශශිත් ශාලික ද සොයිසා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කනදරා කෝරළේ, නැගෙනහිර නුවරගම්පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අනුරාධපුර මහ නගර සභා බලසීමාව ඇතුළත, අංක 254 - පියවර II ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අනුරාධපුර නගරයේ පිහිටි බුද්ධගයා මාවත, වරිපනම් අංක 33/7 දරන කුඹිව්වන්කුලම මූකලාන නමැති ඉඩමට (ක්ෂේත්‍ර සටහන් අංක 137හි අතිරේක අංක 1හි අ.න.සි. A03හි ලොට් 1318 හි නැවත මැනීමක් වන) බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් සාදන ලද 2018.07.23 දිනැති අංක 13454 දරන පිඹුරේ දැක්වෙන ලොට් 01 වශයෙන් ලකුණු කොට බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම තුනයි හතරක් (අ.0, රූ.0, පර්.22.34) හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි පහයි හයයි පහක් (0.0565) විශාල ඉඩම එහි පිහිටි සියලු දේ ද සමග වේ.

මිනුම්පතිවරයා විසින් නිවැරදි බවට තහවුරු කරන ලද අ.න.සි. A30 හි ලොට් අංක 1319 (අඩි 20ක් පළල පාර) මතින් සහ ඔස්සේ වන මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත සඳහන් දේපළ,

2026 ක් වූ නොවැම්බර් මස 11 වන දින පෙ.ව. 11.30 ට

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම -:
දහයියාගම හංදියේ වටරවුමේ සිට ඩී. එස්. සේනානායක මාවත ඔස්සේ කි.මී. 1 ක් පමණ දුරක් ගොස් S.O.S. මංසන්ධිය දක්වා පැමිණ එම මාර්ගය දිගේම තවත් මීටර් 400 ක් පමණ දුරක් ඉදිරියට ගොස් වම් පසට ඇති අතුරු මාර්ගයට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මීටර් 150ක පමණ දුරක් ඉදිරියට ගොස් නැවතත් වම්පසට ඇති මාර්ගයට හැරී තවත් මීටර් 25ක පමණ දුරක් යන විට දකුණු පසින් තවත් අතුරු මාර්ගයක් හමුවේ. එම මාර්ගයට යාබදව අදාළ දේපළ මාර්ග දෙකටම මුහුණලා පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම -:

2026.09.18 දින රජයේ *ගැසට් පත්‍රයේ පළ වී ඇති අතර* ද, දිවයින, ද අයිලන්ඩ්, *තිනකුරල්* යන පුවත්පත්වල 2026.09.04 දින පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය :

සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙළා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) ;
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000/-;
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 2,000/- ;
6. සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා විමසන්න :

අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය,
ඩී.එෆ්.සී.සී. බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.
දුරකතන අංක : 011 2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය.

එම්. එච්. ටී. කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3,
විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011 3068185, 011 2572940.

10-582

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියයි

තිස්සමහාරාමය මහසෙන්පුර ග්‍රාමයේ පිහිටි රූඩ් 1ක් විශාලැති අගනා දේපළක්.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත මහසෙන්පුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහසෙන්පුර ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, රජයේ ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ආර්. ඒ. සෝමදාස විසින් සාදන ලද 2009.04.07 දින අංක 2009/40 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ඇති ලොට් අංක ඒ දරන ඉඩම කොටස සහ එහි පිහිටි පස, ගහකොළ, වගාවන් සහ ඒ මත වූ වෙනත් සියලු දේ සහ,

තවද මෙහි ඉහත සවිස්තරව දැක්වෙන ඉඩම් කැබැල්ල වර්තමානයේ සවිකර ඇත්තාවූ විදුලිබල සැපයුම් පද්ධතිය, ජල පහසුකම් පද්ධති උපාංගය, විදුලි සංදේශ උපාංගය සහ වායු සමීකරණ උපාංගය ඇතුළු ඉහත සවිස්තරාත්මකව සඳහන් කර ඇති ඉඩම් කොටස සඳහා දැනට හෝ මෙහි මින්මතු කලින්කල සම්බන්ධ කරනු ලැබ ඇති හෝ ලැබිය හැකි හෝ ස්ථිරව සවිකරනු ලැබ ඇති හෝ සවි කරනු ලැබිය හැකි සියලු එක්ව හා වෙන් වෙන්ව වූ නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපාංග, සවිකුරු, සවිකිරීම් සහ සේවාවන් ද සමග වේ.

තිස්සමහාරාම ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. උදේශ් ප්‍රියංක විසින් 2019 ජූලි මස 19 වන දින සහතික කරන ලද අංක 766 දරන උකස්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීමට පුංචි හේවගේ තිවංක මදුශංක විසින් පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ,

2026ක් වූ නොවැම්බර් මස 18 වන දින පෙ.ව. 11.00 ට

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා :-

2026.06.19 දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2025.11.21 දින "දිවයින" , "දි අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" යන පුවත්පත් බලන්න.

දේපළට ප්‍රවේශ්ට වන මාර්ගය :-

තිස්සමහාරාම නගරයේ සිට කතරගම පාර ඔස්සේ කි.මී. 2.5ක් පමණ මුරපොළ කඩේ මංසන්ධිය දක්වා ගමන් කර දකුණට පිහිටි වැළිආරගොඩ පාරට හැරී ඉදිරියට මීටර් 20 ක් පමණ ගමන් කිරීමෙන් අදාළ දේපළ පාරේ වම් පසින් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය :-
වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් 10% ක් ද ;
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ;
3. වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදු ද;
4. සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද ;
5. ලිපිකරු හා ඝෝෂකගේ ගාස්තු වශයෙන් රු. 1,500.00ක් ද;
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශවයෙන් රු.3,000/- ක් ද වේ.

ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

නිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ, අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී. හි කළමනාකරු මධ්‍යගත ණය අයකිරීම්ගෙන් විමසන්න.
දුරකතන අංක : 2448448, 011 7448448.

පී.කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134,
බෑද්දගාන පාර,
කෝට්ටේ.
දුරකතන අංක : 011 2873656, 0777672082,
ෆැක්ස් :011 2871184.

10-550

හැටන් නැෂනල් බැංකුව
(පෙර හැටන් නැෂනල් බැංකුව ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මඟින් පිරිනමන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

වටිනා දේපළක් වන බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මීගමුව මහනගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 5 හි 73ඒ - කුඩාපාදුව ග්‍රාම නිලධාරී වසම තුළ කුඩාපාදුවේ පිහිටි "මඤ්ඤෝක්කාහේන, විල්මරත්තඩිතෝට්ටම් සහ මඤ්ඤෝකාහේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද අංක 6098/1 හා 2008.04.08 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් විස්ස (අ.0, රූ.0, පර්.20) ක් වූ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එම ඉඩමේ පිහිටි සියලුම පිහිටි සියලුම ගොඩනැගිලි, සවිකිරීම්, ගස්කොළන්, වගාවන්, පස සහ අනෙකුත් සියලුම දෑ ද මෙයට ඇතුළත් වේ.

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි වාසියට ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 4785 හා 2014.10.29 දින දරන, අංක 4897 හා 2015.03.09 දින දරන සහ අංක 5304 හා 2016.02.26 දින දරන උකස් බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඩිරාන් සුපුල් දේවපුර ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරා ඇති බලතලවලට අනුව, එකී බැඳුම්කර යටතේ අයවිය යුතු ණය මුදල් ද සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන දේපළ,

වර්ෂ 2026 ක් වූ නොවැම්බර් මස 11 වැනි දින පෙ.ව. 09.30 ට,

එකී දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මීගමුව මහනගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 5 හි 73ඒ - කුඩාපාදුව ග්‍රාමනිලධාරී වසම තුළ කුඩාපාදුවේ පිහිටි "මඤ්ඤෝක්කාහේන, විල්මරත්තඩිතෝට්ටම් සහ මඤ්ඤෝකාහේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද අංක 6098/1 හා 2008.04.08 වැනි දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්; උතුරට : අංක 772 දරන පිඹුරේ ලොට් 5 (අඩි 15ක් පළල පාර) සහ අංක 7844/2000 දරන පිඹුරේ ලොට් ඒ1 ද; නැගෙනහිරට : අංක 7844/2000 දරන පිඹුරේ ලොට් ඒ1 සහ අංක 844 දරන පිඹුරේ ලොට් 11 ද; දකුණට : ස්ටීවන් ප්‍රනාන්දුගේ ඉඩම සහ බස්නාහිරට : අංක 7822/2000 දරන පිඹුරේ ලොට් 1 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විස්ස (අ.0, රූ.0, පර්.20) ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා -
2026.05.29 වන දින *ශ්‍රී ලංකා රජයේ ගැසට් පත්‍රය* සහ 2026.06.12 දිනැති දිනමිණ, ඩෙලි නිවුස් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම -
මීගමුව නගර මධ්‍යයේ සිට මීගමුව - හලාවත මාර්ගය (A3) ඔස්සේ පෙරියමුල්ල හන්දිය දක්වා පැමිණ වමට ඇති ඇඩ්නිවිස් (Adnews) පාරට හැරෙන්න. ඉන් පසු එම මාර්ගයේ මීටර් 600ක පමණ දුරක් තුන්මං හන්දිය දක්වා ගමන් කර දකුණු පස ඇති කනත්ත පාරට හෝ සුසාන භූමි පාරට හැරෙන්න. කනත්ත පාර

ඔස්සේ මීටර් 450ක් පමණ දුරක් ගමන් කර දකුණට ඇති අඩි 15ක් පළල මාර්ග රක්ෂිතයට හැරෙන්න.

අදාළ දේපළ ඒත්තුකාල පාරේ සිට මීටර් 10ත් 150ත් පමණ දුරකින් දකුණු පසින් පිහිටා ඇති අතර, එය අංක 44/10, කනත්ත පාර හෝ සුසාන භූමි පාර යන තක්සේරු අංකය දරයි. තවද එය "එම්/එස්.හෝටල් රොමානෝ" (M/S. HOTEL ROMANO) ලෙස නම් කර ඇත. මෙම දේපළ හඳුනාගැනීම පහසුය.

ගෙවීමේ ක්‍රමය -

වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුයි.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු මුදල සියයට එකක් (1%) විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු ;
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද ;
5. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව ලෙස රු. 2,000 ක් ද ;
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000/-ක් ද වේ.

7. තවද ගැනුම් මිලෙන් සියයට අනූවක් (90%) ක් වූ ඉතිරි මුදල, විකිණීමේ දින සිට දින තිහක් (30) ඇතුළත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. තව ද දින තිහක් (30) ඇතුළත ඉතිරි මුදල නොගෙවිවහොත්, ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා -
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම්,
හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.,
අංක 479, ටී.බී.ජායා මාවත,
කොළඹ 10.
දුරකථන අංක : 011 2661833, 011 2661836, 011 2661826.

කේ. පී. එන්. සිල්වා (සා.වි.)
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්.

අංක 501/10,
ධර්මපාල මාවත, කලපළුවාව පාර,
අග්ගොන, අංගොඩ.
දුරකතන : 011 2868872, 0778441812
ඊමේල් : Premalalnsilva@gmail.com

10-588

කාර්ගිල්ස් බැන්ක් පී.එල්.සී.
(පෙර කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්) - ආයතනික ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

එනම් අමරත්ත ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්, බන්ධනදායි වශයෙන් සහ පීටර් ලැම්බර්ට් ආරෙන්ටිස් උකස්කරු වශයෙන් කොළඹ 03, ගාලු පාර, අංක 696 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි ලියාපදිංචි අංක PQ 00293614 කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී, (ලියාපදිංචි අංක PB 4847 කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් ලෙස පෙර හැඳින් වූ) නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. සෝලංගආරච්චි ගුණතිලක විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.12.08 දිනැති අංක 568 සහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.10.09 දිනැති අංක 6444 දරන උකස් බැඳුම්කර මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය උකස් කොට බැඳ තබා ප්‍රදානය කරන ලද ණය පහසුකම මත ගෙවිය යුතු මුදල් ගොවීම පැහැර හැර ඇති හෙයින්,

කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලතල අනුව පහත සඳහන් දේපළ,

වර්ෂ 2026 ක් වූ නොවැම්බර් මස 09 දින පෙ.ව. 10.00 ට

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා ඇළ මහනගර සභා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ බටුවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ බටගම දකුණෙහි, වරිපනම් අංක 72/2, කපුවාගාර පාරෙහි "සිරිලෙන එස්ටේට්" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 2610 සහ 2004 පෙබරවාරි මස 27 දින දරන පිඹුර ප්‍රකාර, බෙදා වෙන්කරන ලද කැබලි අංක 24 දරන කැබැල්ලට මායිම් : උතුරට : මෙහි කැබලි අංක 23 ද; නැගෙනහිරට : මෙහි කැබලි අංක 22 ද; දකුණට : බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් මැන සාදන ලද අංක 4168 දරන පිඹුරේ කැබලි අංක 5 ද; සහ බස්නාහිරට : අංක 4168 දරන පිඹුරේ කැබලි අංක 5 ද ඉහත කී පිඹුරු අංක 2610 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම අටයි බින්දුවක් (පර්. 13.80) වන ඉඩම් කොටස සහ ඊට අයත් ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ සියලුම දේ වන අතර මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු අංක J 538/40 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 4168 දරන පිඹුරෙහි කැබලි අංක 10 හි මාර්ග පරවශ්‍යතා අයිතිය ද සමග.

දේපළට පිවිසීම :

කොළඹ සිට මීගමුව පාර ඔස්සේ කඳාන හංදිය දක්වා පැමිණ දකුණට ඇති දුම්රියපල පාරෙන් (ගනේමුල්ල පාර) කි.මී. 2.22ක් දුරින් ඇති 1 කණුව හංදිය දක්වා පැමිණෙන්න. පසුව වමට ඇති කපුවාගාර පාරෙන් මීටර් 480ක් දුරින් ඇති තුන්මං හන්දිය දක්වා පැමිණ දකුණට ඇති සිරිලෙන වත්ත පාරෙන් මීටර් 200ක් දුරින් ඇති හතරමං හන්දිය දක්වා පැමිණෙන්න. පසුව දකුණට ඇති පාරෙන් මීටර් 50ක් ගියපසු මෙම විෂයගත දේපළ වමට වන්නට පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම :

රජයේ ගැසට් පත්‍රයේ 2026.03.20 දින හා ඩෙලි නිවුස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත් වල 2026.03.20 දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය :

සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

(1) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ;

(2) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද ;

(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් ගැණුම් මිලෙන් 2.5% (සියයට දෙකහමාරක්) සමග අදාළ බදු මුදල් ;

(4) සියලුම ප්‍රචාරක වියදම් සමග වෙන්දේසිය සඳහා වන සියළු මුදල් ;

(5) ලිපිකරු සහ සෝෂක වේතන රු.2,000/- ;

(6) විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 5,000.00

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවා නිමකළ යුතුය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න :

අයකර ගැනීම් ප්‍රධානී,
කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී,
අංක 696, ගාලු පාර,
කොළඹ 03.
දුරකතන අංක : 011 7640450.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය.

වන්දිමා ප්‍රියදර්ශනී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 9-I,
හයිලෙවල් පාර,
සර්වෝදය මාවත,
පනාගොඩ,හෝමාගම.
දුරකථන අංක : 011 2173282/0714318252.

10-628

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

උපලේඛනය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වාවකච්චේරි ප්‍රාදේශීය සභා සීමාව තුළ, තෙන්මාරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 233/J දරන එලුතුමට්ටුවාල් ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත මිරුසුවිල් මීසමේ එලුතුමට්ටුවාල් යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද, "මිරුසුවිල් කාඩු" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඒ. අරුල්නේසන් විසින් මැන සාදන ලද 2014.01.15 දින අංක 1919 පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණුකර නිරූපනය කර බෙදා වෙන් කළ ඉඩම් කොටස.

ප්‍රමාණය ලාවම් හතලිස් හතකුයි කුලී තුනයි දශම අටයි හතක් (ලා.47, කු.3.87) අක්කර තුනකට (අ.3) සමාන බිම් ප්‍රමාණයකින් යුක්ත වන විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස සහ ඒ මත පිහිටි ගහකොල, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග මෙම දේපළ යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 867/91 යටතේ ලියාපදිංචි කර ඇත.

ලින්ක් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් ලබා ගෙන ඇති මූල්‍ය පහසුකම් යථා පරිදි ආපසු ගෙවීම සඳහා වූ ඇපකරයක් වශයෙන්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මහතෙල්ගේ සජානි කැමීලියා පීරිස් විසින් සහතික කරන ලද 2020 ජනවාරි මස 14 දින අංක 1563 දරන උකස් බැඳුම්කරය මගින්, බන්ධනදායී/

උකස්කරු වශයෙන් ඉහත කී ලින්ක් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය අංක 46/58, නවම් මාවත, කොළඹ 02 යන ලිපිනයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී ආයතනය වෙත උකස්කර පවරා දී ඇති හෙයින් ද, එකී බැඳුම්කරය මගින් ඇපයෙන් සහතික කරන ලද පහසුකම් මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම එකී ලින්ක් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමටඩ් යන ආයතනය පැහැර හැර ඇති හෙයින් ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව,

උපලේඛනයේ දැක්වෙන දේපළ,

වර්ෂ 2026ක් වූ නොවැම්බර් මස 10 දින පෙ.ව. 10.30ට

අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***දේපළ වෙත පිවිසීම* :-**
වාවකච්චේරි බස් නැවතුම් පොලේ සිට A-9, යාපනය - නුවර පාර ඔස්සේ කිලිනොච්චි දෙසට කිලෝමීටර් 11ක දුරක් ගමන් කර අඩි 12 1/2 පළල පටුමගකට වමට හැරී මීටර් 300ක දුරක් ගමන් කළ විට දේපළ මෙම පාර මායිමට දකුණේ පිහිටා ඇත.

***ගෙවීම් කළ යුතු ආකාරය* :-**
විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් ද (10%),
2. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි තැන්පත් කළ යුතුය. ;
3. පළාත් පාලන අයබදු සියයට එකයි (1%) ;
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%);
5. සියලුම ගැණුම්කරුවන් වෙන්දේසියට ප්‍රථම තම අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය.
6. ප්‍රවාරක වියදම් සහ අනිකුත් වියදම් 100% ;
7. ලිපිකරු හා සෝෂක චෙතනය රු. 3,500/- ;
8. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම්.

අනිකුත් තොරතුරු සඳහා පහත නිලධාරීන්ගෙන් විමසන්න.

නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී,
අංක 46/58,
නවම් මාවත,
කොළඹ 02.
දුරකථන අංකය : 011 4218746.

බී. එම්. ආර්. බස්නායක,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

අංක 7/2/41, දෙවන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල,
කොළඹ 08.
දුරකථනය අංක : 076 2387066/071 8047659.

10-553

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළේ, මැද පත්තුවේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 179 මාරපන ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත මාරපන ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, "කුඩුගලහේන කැල්ල *හෙවත්* කුඩුගල හේන" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා සහ ඉඩම සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු එච්. එම්. සී. බී.බී. හිටිහාමු විසින් සාදන ලද 2024 ජනවාරි මස 29 දින අංක 4026 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කර නිරූපනය කර ඇත්තා වූ ඉඩම් කොටස.

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් දාහතක් (රූ.1, පර්.17) හෙවත් හෙක්ටයාර් 0.1442ක් ඉඩම් කොටස සහ ඒ මත වූ ගහකොළ, වගාවන්, එහි පස, ස්ථිර ගොඩනැගිලි, ජල ටැංකිය සහ වෙනත් සියලු දේ ද වේ. මෙම ඉඩම රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ M 205/92 දරන වෙළුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අංක 4046 දරන පිඹුරේ නිරූපිත ඉහත කී ලොට් අංක 01 දරන ඉඩම් කොටස පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ. එනම්,

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළේ, මැද පත්තුවේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාරපන ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත මාරපන ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "කුඩුගලහේන කැල්ල හෙවත් කුඩුගල හේන" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා සහ ඉඩම සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු එම්. වර්ණසූරිය විසින් සාදන ලද 2010 ජූලි මස 16

දින අංක 1447 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කර නිරූපනය කර ඇත්තා වූ ද, අංක 1447 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දාහතක් (රූ.1, පර්.17) හෙවත් හෙක්ටයාර් 0.1442 ක් වූ ද, රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ (B 549/195) B 549/260 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අංක 1447 දරන පිඹුරේ නිරූපිත ඉහත කී ලොට් අංක 01 දරන ඉඩම් කොටස පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ. එනම්,

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළේ, මැද පත්තුවේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාරපන ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත මාරපන ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "කුඩුගලහේන" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා සහ ඉඩම සම්බන්ධයෙන් ලොට් 58^{B} ලෙස ලකුණු කර නිරූපනය කර ඇත්තා වූ ද, ඉහත කී අංක 1447 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දාහතක් (රූ.1, පර්. 17) හෙවත් හෙක්ටයාර් 0.1442 ක් වූ ද, රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ M 45/51 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි ඇත්තා වූ ද ඉහත කී ලොට් අංක 58^{B} දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස.

ජයලත් මුදියන්සේලාගේ නිශාන්ත පුෂ්ප කුමාර සහ ජයවීරගම ඇතිරාලලාගේ බ්‍රාහ්මණවත්ත උපාලි ජයවීර යන අය විසින් ලබාගෙන ඇති මූල්‍ය පහසුකම් යටා පරිදි ආපසු ගෙවීම සඳහා වූ ඇපකරයක් වශයෙන්, රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් දෝන පාඨලු ආරච්චිගේ ඉනෝකා ශ්‍යාමිනී ජයසේකර විසින් සහතික කරන ලද 2024 මාර්තු මස 20 දින අංක 3140 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මගින් සහ එම නොතාරිස්වරයා විසින් ම සහතික කරන ලද 2025 පෙබරවාරි මස 24 දින අංක 3411 දරන ද්විතීය උකස් බැඳුම්කරය මගින් බන්ධනදායින් වශයෙන් ජයලත් මුදියන්සේලාගේ නිශාන්ත පුෂ්ප කුමාර සහ ජයවීරගම ඇතිරාලලාගේ බ්‍රාහ්මණවත්ත උපාලි ජයවීර යන අය විසින් ද, උකස්කරු වශයෙන් ජයවීර ඇතිරාලලාගේ බ්‍රාහ්මණවත්ත උපාලි ජයවීර යන අය විසින් ද කැමැත්ත පළ කිරීමේ පාර්ශවය වශයෙන් ජයලත් මුදියන්සේලාගේ නිශාන්ත පුෂ්ප කුමාර යන අය විසින් ද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය අංක 46/58, නවම් මාවත, කොළඹ 02 යන ලිපිනයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී ආයතනය වෙත උකස් කර පවරා දී ඇති හෙයින් ද, එකී උකස් බැඳුම්කරය මගින් ඇපයෙන් සහතික කරන ලද පහසුකම් මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම එකී ජයලත් මුදියන්සේලාගේ නිශාන්ත පුෂ්ප කුමාර යන අය විසින් සහ ජයවීර ඇතිරාලලාගේ බ්‍රාහ්මණවත්ත උපාලි ජයවීර යන අය පැහැර හැර ඇති හෙයින් ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව,

උපලේඛනයේ දැක්වෙන දේපළ,

වර්ෂ 2026ක් වූ නොවැම්බර් මස 13 දින පෙ.ව. 11.00ට

අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***දේපළ වෙත පිවිසීම* :-**
රත්නපුර නගරයේ සිට ඇඹිලිපිටිය පාරේ තිරවනාකැටිය හංදිය තෙක් කිලෝමීටර් 4ක් ගමන් කර නිවිතිගල පාරට දකුණට හැරෙන්න. නිවිතිගල පාරේ කිලෝමීටර් 1ක් ගමන් කර මාරපන පාරට දකුණට හැරෙන්න. මාරපන පාරේ මීටර් 500ක් ගමන්කර දැල පාරට වමට හැරෙන්න. එම පාරේ කිලෝමීටර් 1ක් ගමන් කරන විට මෙම දේපළ පාරේ වම් පසට වන්නට පිහිටා ඇත.

***ගෙවීම් කළ යුතු ආකාරය* :-**
විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් ද (10%),
2. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි තැන්පත් කළ යුතුය. ;
3. පළාත් පාලන අයබදු සියයට එකයි (1%) ;
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%);
5. සියලුම ගැණුම්කරුවන් වෙන්දේසියට ප්‍රථම තම අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය.
6. ප්‍රවාරක වියදම් සහ අනිකුත් වියදම් 100% ;
7. ලිපිකරු හා සෝෂක චේතනය රු. 3,500/- ;
8. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම්.

අනිකුත් තොරතුරු සඳහා පහත නිලධාරීන්ගෙන් විමසන්න.

නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී,
අංක 46/58,
නවම් මාවත, කොළඹ 02.
දුරකථන අංකය : 011 4218746.

බී. එම්. ආර්. බස්නායක,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

අංක 7/2/41, දෙවන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල,
කොළඹ 08.
දුරකථනය අංක : 076 2387066/071 8047659.

10-557

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වගන්තිය යටතේ ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ, පිටිගල් කෝරළේ, දකුණේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලුත්තොට ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ අලුත්තොට ගමෙහි පිහිටි "දොඹගහවත්ත, මදටියගහවත්ත සහ අඩජ්පනාර් පල්ලම" නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු එම්. ජී. ෂෙල්ටන් සමරතුංග විසින් මැන සාදන ලද 2006.04.26 දිනැති 6000 දරන පිඹුරෙහි දැක්වෙන (බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් මැන සාදන ලද 1997.12.31 දිනැති පිඹුරු අංක 5457 හි දැක්වෙන ලොට් 1 හි නැවත බෙදා වෙන් කිරීමකි.) ලොට් 1 දරන දේපළ සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ අනෙකුත් සියලු දෙය වේ. විශාලත්වය පර්චස් දාහත (අ.0, රූ.0, පර්.17.00)

වර්ෂ 2026 ක් වූ නොවැම්බර් මස 17 වැනි දින ප.ව. 12.30 ට

දේපළට පිවිසෙන මාර්ගය :- වෙන්නප්පුව සිට මීගමුව දෙසට වයික්කාල දක්වා ගමන් කර ඉන්ධන පිරවුම්හල පසු වූ සැනින් රන්වැලි හෝටලය යන තාර පාරට හැරී මීටර් 700ක් ටී හන්දිය දක්වා ගමන් කර දකුණට හැරී මීටර් 800 ක් පමණ ඉදිරියට ගොස් එතැනින් වමට හැරී තවත් මීටර් 700 ක් පමණ ගිය විට රන්වැලි හෝටලය ඉදිරිපිට විෂයගත දේපළ පිහිටා ඇත.

වර්ණකුලසූරිය ඇන්ටන් සුජිත් කුමාර ප්‍රනාන්දු *හෙවත්* වර්ණකුලසූරිය ඇන්ටන් සුජීර් කුමාර් ප්‍රනාන්දු යන අය "බන්ධනදායින්/උකස්කරුවන්" වශයෙන් ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට හලාවත ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. තිසේරා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.09.04 වන දිනැති අංක 1003 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2013.09.18 වන දිනැති අංක 1423 දරන ද්විතියික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා -: වර්ෂ 2026.09.11 දිනැති *රජයේ ගැසට් පත්‍රය* ද, වර්ෂ 2026.09.08 සහ 2025.09.24 දිනැති දිවයින, දී අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

ගෙවීමේ ක්‍රමය :- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතුය. එනම්,

1. ගැනුම් මුදලේ 10% ද (සියයට දහයක්) ;
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්) ;
4. ප්‍රචාරක වියදම් ද ;
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද ;
6. ලිපිකරුගේ හා ඝෝෂකගේ ගාස්තුව ද වෙන්දේසියට අදාළ වෙනත් වියදම් ද වේ. ,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවිවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා විමසන්න :
කළමනාකරු - ණය අයකර ගැනීමේ අංශය,
පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී.,
ප්‍රධාන කාර්යාලය,
අංක 450,
ගාළු පාර,
කොළඹ 03.
දුරකථන අංක : 011- 4667229, 011- 4667412 අමතන්න.

එන්. යූ. ජයසූරිය,
උසාවි කොමසාරිස් සහ වෙන්දේසිකරු,

අංක 369/1,
දුටුගැමුණු මාවත,
මාවිල්මඩ,
මහනුවර
දුරකතන අංක : 071 8446374

10-606